# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
සමුர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/07/SD/08/01-AP | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2018.03.13 |
|---|---|---|---|---|---|

සමෘද්ධි චක්‍රලේඛ අංක : 2018/ 08

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

**<u>සමෘද්ධි සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන - 2018</u>**

**<u>"සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබලගැන්වීම" සඳහා සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.</u>**

2030 වසර වන විට දුගී බවෙන් තොර, සවිබල ගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරිමට කටයුතු කරන පුරෝගාමී ආයතනයක් බවට පත්වීම, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර, අතිගරු ජනාධිපතිතුමා විසින් දිළිදුකම පිටුදැකීම සඳහා ප්‍රකාශයට පත් කර ඇති තිරසාර සංවර්ධන වැඩ සටහන අනුව යමින් ඊට අවශ්‍ය මුලික පියවර 2017 වර්ෂයේ දී ආරම්භ කරන ලදි.

02. ඒ අනුව ඔබ ඇතුළු සියළුම සමෘද්ධි නිලධාරින්ගේ සහභාගීත්වයෙන් සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබලගැන්වීම උදෙසා 2017 වර්ෂය තුල දී සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, මේ සඳහා සියළුම නිලධාරින් දක්වන ලද දායකත්වය ඉතා අගය කොට සලකමි.

03. මේ සම්බන්ධව ඔබ වෙත යොමුකළ සමාංක හා 2018.02.01 දිනැති ලිපිය කෙරෙහි මෙන්ම 2018 වසරේ සවිබල ගැන්වීමේ වැඩසටහන සම්බන්ධවව වන සැලසුම් අංශය, සමාජ සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන අංශය, ක්ෂුද්‍ර මූල්‍ය අංශය හා අලෙවි අංශයේ චක්‍රලේඛ කෙරෙහි ද ඔබගේ අවධානය යොමුකරවන අතර ඒ අනුව සවිබල ගැන්වීමේ වැඩසටහන සඳහා තෝරා ගනු ලබන ප්‍රතිලාභීන් ඉලක්ක කරගනිමින් කටයුතු කළ යුතුවේ. 2017 වර්ෂයේ ආරම්භ කළ සවිබලගැන්වීමේ වැඩ පිළිවෙල ඉදිරියට ගෙන යමින් 2018 වර්ෂයේ දී සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 125,000 ක් ආර්ථික, සමාජයීය ශාරීරික, මානසික, පාරිසරික, නෛතික හා දේශපාලනික වශයෙන් සවිබලගැන්වීමට අපේක්ෂා කරන අතර, ඒ අනුව එම

පවුල් මුහුණ දෙන සමාජීය ගැටළු නිවැරදිව හඳුනා ගනිමින් ඒවා ජය ගැනීම ඉලක්ක කර සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට වැඩසටහන් සැලසුම් කරගත යුතුවේ.

04. 2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සමාජ සංවර්ධන වැඩසටහන් පහත දක්වා ඇති අතර එක් එක් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ඇමුණුම් අංක 1 සිට 5 ලෙස දක්වා ඇත.

| | | |
|---|---|---|
| 1 | "සමෘද්ධි හරිත දයාද" ආදායම් උත්පාදන රුක්රෝපණ වැඩසටහන | ඇමුණුම 01 |
| 2 | දිරිය පියස නිවාස වැඩසටහන | ඇමුණුම 02 |
| 3 | මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණය, ගෘහ කළමනාකරණය හා සතුටු පවුල් වැඩසටහන | ඇමුණුම 03 |
| 4 | සමෘද්ධි කැකුළු ළමා සමාජ හා සංස්කෘතික වැඩසටහන | ඇමුණුම 04 |
| 5 | උපදේශන වැඩසටහන | ඇමුණුම 05 |

05. ඒ අනුව ඉහත ඉලක්කයන් සාධනය කරගත හැකි ආකාරයෙන් ඔබ දිස්ත්‍රික්කයේ සමාජ සංවර්ධන හා පරිසර වැඩ සටහන් සැලසුම් කරගත යුතු අතර එක් එක් වැඩසටහන සඳහා දිස්ත්‍රික් මට්ටමින් කාර්තුමය වශයෙන් මුදල් ලබාදීමට අදාල විස්තර ඇමුණුම් අංක 06 යටතේ දක්වා ඇත. යෝජිත වැඩසටහන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන වලට අමතරව 2016/06, 2017/04 චක්‍රලේඛවල සඳහන් සීමාවන් අනුව සමාජ සංවර්ධන පදනමෙහි අරමුදල් ද DSD/HO/09/CBO/කොඩි හා 2018.02.19 දිනැති ලිපියේ උපදෙස් අනුව ප්‍රජාමූල සංවිධාන කොඩි අරමුදල් ද යොදවා ගත හැකි අතර ඒ අනුව වැඩසටහන් සංවිධානය කරගන්නා ලෙස දන්වමි.

06. 2018 වර්ෂයේ සමාජ සංවර්ධන හා පරිසර සංවර්ධන වැඩසටහන් සඳහා වෙන්වන ප්‍රතිපාදන වලින් වැය කරන මුදල අනුව 2.5% පරිපාලන වියදමක් දැරිය හැකිය. එම පරිපාලන වියදම 0.5% ප්‍රධාන කාර්යාලයටත්, 0.5% දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ කාර්යාලයටත්, 1.5% ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පරිපාලන වියදම් ලෙසත් වෙන්වන අතර ඒ අනුව වැඩසටහන් සැලසුම් කරගන්නා ලෙස දන්වමි.

07. ඉහත වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක වේද යන්න මැන බැලීමටත්, ගැටළු සමාලෝචනය තුලින් නව යෝජනා ඉදිරිපත් කිරීමටත් ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ප්‍රගති සමාලෝචනය සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

ප්‍රාදේශීය මට්ටම - සියලුම වසම් ආවරණය වන පරිදි සැම මසකම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ප්‍රගති වැඩමුළු පැවැත්වීම හා ප්‍රගතිය දිස්ත්‍රික් මට්ටමට ලබාදීම.

දිස්ත්‍රික් මට්ටම - දිස්ත්‍රික් අධ්‍යක්ෂගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල කළමනාකාර අධ්‍යක්ෂවරුන්/මූලස්ථාන කළමනාකරුවන් හා සමාජ සංවර්ධන සහකාර වරුන්ගේ සහභාගිත්වයෙන් සෑම මසකම පැවැත්විය යුතුය .

ජාතික මට්ටම - දිස්ත්‍රික් සමාජ සංවර්ධන කළමනාකරුවන්ගේ සහභාගිත්වයෙන් සෑම මාස තුනකටම වරක් හා සමාජ සංවර්ධන සහකාරවරුන්ද ඇතුලුව වර්ෂයකට දෙවරක් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට කටයුතු කෙරේ.

ඉහත වැඩසටහන් වල ප්‍රගතිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් මාසිකව ඇගයීම සඳහා මාර්තු මස සිට ඉදිරි මාස 10 සඳහා ඔබ දිස්ත්‍රික්කයට ප්‍රතිපාදන ලබාදෙනු ඇත. සෑම මාසයකම ප්‍රගති වැඩමුළු පැවැත්වීම අත්‍යවශ්‍ය වන අතර අඛණ්ඩව මාස 02 ක් ප්‍රගති සමාලෝචන වැඩමුළු නොපැවැත්වීම ප්‍රතිපාදන ලබාදීම අත්හිටුවීමට හේතු වේ.

08. ඉහත සමස්ථ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දි අදාල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු බව වැඩිදුරටත් දන්වමි. දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති වල ප්‍රගතිය සෑම මසකම 05 දිනට පෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබාගෙන පහත ඇමුණුම් අංක 07 හා 08 අනුව සමෘද්ධි සමාජ සංවර්ධන අංශය වෙත සෑම මසකම 10 දිනට පෙර එවිය යුතුය. (කඩිනමින් තොරතුරු යොමු කිරීම සඳහා socialdev@divineguma.gov.lk විද්‍යුත් ලිපිනය හෝ 0112-889005 දරණ ෆැක්ස් අංකය ද භාවිත කළ හැකිය) මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් වැඩි විස්තර 0112-889005, 0112-876601 දුරකතන අංක වලට සමාජ සංවර්ධන අංශය ඇමතීමෙන් ලබාගත හැකිය.

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

01. ගරු සමාජ සවිබලගැන්වීම්, සුභ සාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍ය
එස්.බී.දිසානායක මැතිතුමා - කා.දැ.ගැ.ස.

02. ගරු සමාජ සවිබලගැන්වීම්, සුභ සාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ
නියෝජ්‍ය අමාත්‍ය රංජන් රාමනායක මැතිතුමා - කා.දැ.ගැ.ස

03. ලේකම්, සමාජ සවිබලගැන්වීම්, සුභ සාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස

04. අතිරේක ලේකම්, (ග්‍රාම සංවර්ධන හා පරිසර)
සමාජ සවිබලගැන්වීම්, සුභ සාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.

05. විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.

06. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.

07. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.

08. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු - කා.දැ.ගැ.ස.